ධනාත්මක සමාජයක් වෙනුවෙන් ඍණාත්මක ලේබල්කරණයන්ගෙන් වළකිමු!

මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් සහ මත්ද්‍රව්‍ය සඳහා සම්බන්ධ වූවන් හැඳින්වීමට සමාජය තුළත්, මාධ්‍ය තුළත්, පොදුවේ බහුලව භාවිතා වන යෙදුමක් ලෙසින් "කුඩ්ඩෝ" යන්න හැඳින්විය හැක.

මත්ද්‍රව්‍ය ගැටලුව මර්දනය කිරීම සඳහා කළ යුත්තේ, ඊට ඇබ්බැහි වූවන්ව ගර්හාවට ලක්කොට සමාජයෙන් කොන් කිරීම ද, නැතිනම් ඔවුන්ට පුනරුත්ථාපනයකින් පසු නැවත සමාජයට එක් විය හැකි පසුතලයක් සකස් කිරීමද යන්න අප ඇසිය යුතු ප්‍රශ්නයකි.

එම පසුබිම තුළ, මාධ්‍ය විසින් "කුඩ්ඩා" වැනි යෙදුම් ඔස්සේ, ඔවුන්ව ගර්හාවකින් සහ කොන් කිරීමකින් යළි යළිත් ලේබල්කරණය කිරීම කෙතරම් උචිත දැයි පාඨක අප ඇසිය යුතුය.

2023 අගෝස්තු මස දින කිහිපයක, දිනමිණ, දිවයින, සහ ලංකාදීප පුවත්පත් තුළ පුවත් වාර්තාවන් කිහිපයක සිරස්තලයන් පහත දැක්වේ.

ඔබ සිතන ආකාරයට,

1) "කුඩ්ඩා" යන යෙදුම සමඟ බැඳී ඇති ගර්හාත්මක සහ නිශේධනාත්මක අර්ථය සමගින්, ඔවුන්ට සමාජයෙන් එල්ලවන කොන්කිරීම තවත් තීව්‍ර නොවන්නේද ?

2) ඒ වෙනුවට "මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්" වැනි යෙදුමක් වඩාත් උචිත නොවන්නේද?